# ජනශ්‍රැතියෙන් ඉස්මතුකරන ශ්‍රී ලංකාවේ පුරාණ ප්‍රවාහනය හා බැඳුනු සමාජ සංස්කෘතිය පිළිබඳ ව සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

ටී. ජී. ඩී. උදයකාන්ති[1], චන්දන රෝහණ විතානාච්චි

## සංක්ෂේපය

මානව සමාජය තුළ ඥාන සම්පාදනය වූයේ ජනශ්‍රැතිය මඟිනි. එය සමාජයේ අනන්‍යතාවය යි. පොදු ජනයා අතර පවතින සම්ප්‍රදායික විශ්වාස, පුරාවෘත්ත හා සිරිත් විරිත් ජනශ්‍රැතියට අයත් වේ. පැරණි සමාජයේ පැතිකඩ ජනශ්‍රැතිය තුළින් හඳුනාගත හැකි අතර එය සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම බැඳි පවතින්නකි. ඒ අනුව පැරණි සමාජය තුළ ප්‍රවාහනය හා බැඳුනු ජනශ්‍රැතියක් හඳුනාගත හැකි ය. මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටළුව වන්නේ ජනශ්‍රැතිය තුළින් පුරාණ ලංකාවේ ප්‍රවාහන විධි හා ඒ හා බැඳුනු සමාජ සංස්කෘතික පසුබිම පිළිඹිබු කරනවා ද යන්න අධ්‍යයනය කිරීම ය. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ පුරාණ ලාංකේය ජනශ්‍රැතිය තුළින් මතු කෙරෙන ප්‍රවාහන විධි හා ඒ හා බැඳුනු සංස්කෘතිය හඳුනාගැනීම වන අතර ප්‍රවාහනය හා බැඳුනු ජනශ්‍රැතියක් නිර්මාණය වීමට බලපෑ හේතු හඳුනාගැනීම, පැරණි ප්‍රවාහන මාධ්‍යයන් හා එහි සමාජ ආර්ථික වැදගත්කම හඳුනාගැනීම අතුරු අරමුණු වේ. මෙම පර්යේෂණය ද්විතීක දත්ත මත පදනම් වූවක් විය. ජනශ්‍රැතිය තුළින් පැරණි ලංකාවේ ප්‍රවාහන විධි යළි ප්‍රතිනිර්මාණය කිරීමට සමත් වී ඇති බව පැහැදිලි ය. පැරණි ලාංකේය ගැමි සමාජය තුළ කරත්තය ප්‍රධාන ගමන් රථයක් වූ අතර එය භාණ්ඩ ප්‍රවාහනයට, ගමන් බිමන් යාමට පමණක් නොව මඟුල් තුලා හා සෙසු සමාජීය සහ ආගමික උත්සව සඳහා ද උපයෝගී කර ගන්නා ලදි. කරත්ත භාවිතය පදනම් ව බිහි වූ කරත්ත කවි යනු පැරණි ප්‍රවාහනය පිළිබඳ සාක්ෂි සපයන ප්‍රධාන ජනශ්‍රැතියක් විය. ජල මාර්ග ආශ්‍රිත ප්‍රවාහනය තුළ පාරුව වැදගත් ප්‍රවාහන මාධ්‍යයක් වූ අතර ඒ හා බැඳුණු පාරු කවි ජනශ්‍රැතිය තුළ සුවිශේෂි වේ. ගමනාගමනයේ දී මගතොට ගිමන් හරින ලද අම්බලම ආශ්‍රිත ව ද අපූරු උපසංස්කෘතියක් ගොඩනැගී තිබුණු බවට ජනශ්‍රැතිය සාක්ෂි දරයි. ආරම්භයේ සිට ම දුම්රිය සමග බැඳුණු උපසංස්කෘතියක් බිහිවී තිබෙන අතර එය තත්කාලීන සාමාජීය මනෝභාවයන් හෙළි කරන්නකි. මගතොටේ දී පාළුව මකාගැනීමට ගැයූ සීපද, ජන කවි ලෙස සමාජගත වූ අතර ඒවා එකල සමාජ ආර්ථික ක්‍රියාවලියේ හරස්කඩ මතු කරන්නකි. ගමනාගමනය සමඟ බැඳුනු චාරිත්‍ර විධි හා පෙරමග ලකුණු බැලීම ක්‍රියාකාරකම් පැරණි ග්‍රාමීය සමාජ තුළ තිබුණු බවට ඓතිහාසික මූලාශ්‍රයෝ සාක්ෂි දරයි. ඒ අනුව පැහැදිලි වන්නේ ජනශ්‍රැතිය තුළින් මතු කරන ප්‍රවාහනය පිළිබඳ තොරතුරු පැරණි ලාංකේය සමාජ සංස්කෘතියේ එක් පැතිකඩක් අනාවරණය කරන බව ය.

***මුඛ්‍ය පද:*** *අම්බලම, උපසංස්කෘතිය, ජනශ්‍රැතිය, ප්‍රවාහනය*

---

[1] සමාජීයවිද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ.

deepikagamage56@yahoo.com